ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව
රත්නපුර දිස්ත්‍රික්කය

01. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 ජුනි 02 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 අගෝස්තු 07 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජුනි 30 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය.
---------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත කරුණු අඩුපාඩු කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාල එකතුව රු. 41,820 ක වියදම් සඳහා ණයහිමියන් හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබූ බැවින් සමාලෝචිත වර්ෂයේ වියදම සහ ණයහිමියන් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ අවසන් හය මාසට අදාලව රු. 18,782 ක මුද්දර බදු දේශීය ආදායම් කොමසාරිස් ජෙනරාල්ට ප්‍රේෂණය කළ යුතු නමුත්, මුද්දර බදු ලෙජර් ගිණුමේ එම වටිනාකම රු. 188,132 ක් ලෙස ගිණුම්ගත කිරීමෙන් සමාලෝචිත වර්ෂයේ ජංගම වගකීම රු. 169,350 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ)(I) සමාලෝචිත වර්ෂයේ අවසානයට මහජන බැංකුවේ ඇහැලියගොඩ ශාඛාවේ අංක 085-1-001-70000674 දරණ ජංගම ගිණුමේ ශේෂය බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව රු. 4,373,940 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ එම ශේෂය රු. 4,387,551 ක් වශයෙන් දක්වා තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ තුලනතාවය විගණනයේදී ගැටළුසහගත විය.

(II) සමාලෝචිත වර්ෂයේ උක්ත ගිණුමේ දෙසැම්බර් මස බැංකු සැසඳුම් ප්‍රකාශයේ දක්වා තිබූ බැංකු ප්‍රකාශනය අනුව ශේෂය රු. 7,132,651 ක් වුවද, රු. 7,086,575 ක් ලෙස දක්වා තිබුණි.

(ඈ) ගැටහැත්ත බහුකාර්යය ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා දේශීය ණය හා සංවර්ධන අරමුදලින් ලබාගත් ණය මුදල රු. 12,962,804 ක්වූ අතර, එම ණය වාරික මුදල හෝ පොලී මුදල් කිසිවක් සමාලෝචිත වර්ෂයේදීද ගෙවීම් කිරීමට කටයුතු කර නොතිබුණි. නමුත් සමාලෝචිත වර්ෂයේ මුළු වාරික වටිනාකම රු. 1,073,886 ක් වුවත්, ජ'නල් සටහන් අංක 38 මගින් ගෙවිය යුතු වාරික වටිනාකම රු.1,180,000 ක් ලෙස සමාලෝචිත වර්ෂයේ වියදමට ගලපා තිබීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය රු.106,114 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසානයට ඖෂධ තොග ශේෂය රු. 283,187 ක් ලෙස භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව තහවුරු වුවද, එම ශේෂය ඖෂධ තොග ගිණුමේ අවසාන ශේෂය ලෙස සටහන් කිරීමෙන් පසු ගිණුමේ ඇති වන රු. 799,868 ක වෙනස ඖෂධ තොග නිකුත් කිරීම් ලෙස ජ'නල් සටහන් අංක 23 මඟින් ගිණුමට ගලපා තිබුණි. නමුත් ඖෂධ තොග ලේඛණය අනුව සමාලෝචිත වර්ෂයේ තොග නිකුත් කිරීම් කිසිවක් තහවුරු කර ගැනීමට නොහැකි විය.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්
-----------------------------
පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගිණුම් විෂයයන් 09 කට අදාලව සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් සහ උපයෝගී ලේඛණ අනුව ශේෂයන් අතර රු. 3,135,357 ක වෙනසක් දක්නට ලැබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ වැය ශීර්ෂ 22 කට අදාලව වැය ලෙජරය හා සාරාංශ වියදම් ලේඛණය සමඟ සැසඳීමේදී රු. 1,713,875 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
------------------------------------
සේවක ණය ලේඛණයට අනුව සේවය අතහැර යාම හෝ ස්ථාන මාරුවී යාම හේතුකොටගෙන නිළධාරීන් හා සේවකයින් 09 දෙනෙකු ගෙන් එකතුව රු. 63,583 ක් වූ හිඟ ණය ශේෂයක් අයකරගත යුතුව තිබුණි.

1.3.4 නීති රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම
-----------------------------------------------------
පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි වලට හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව. | අනුකූල නොවීම්. |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (I) මුදල් රෙගුලාසි 371 | දෙන ලද අත්තිකාරම් අදාල වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට පියවිය යුතු වුවත්, 1995 වසරේ සිට නොපියවූ අත්තිකාරම් වශයෙන් රු. 2,467,259 ක ශේෂයක් පැවතුණි. |
| (II) මුදල් රෙගුලාසි 396 (ඇ) | 2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ අප්‍රේල් දක්වා කල් ඉකුත් වූ එකතුව රු. 652,116 ක්වූ චෙක්පත් 138 ක් සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (III) | මුදල් රෙගුලාසි 570 සහ 571 | වර්ෂ ගණනාවක් තිස්සේ පැවත එන රු. 2,327,550 ක් වටිනාකමැති කල්ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ආ) | පළාත් පාලන කොමසාරිස් චක්‍රලේඛ. | |
| | 2009 මාර්තු 09 දිනැති අංක පා.පා.කො./2009 චක්‍රලේඛය | යටත් පිරිසෙයින් වර්ෂ 05 කට වරක්වත් තක්සේරුගත බදු කුළිය සංශෝධනය කල යුතු වුවත්, සභාවට අයත් කඩකාමර වැඩි ප්‍රමාණයක ගාස්තු යාවත්කාලීන කිරීමක් සිදු කර නොතිබුණි. |

02. මූල්‍ය සමාලෝචනය
------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු. 6,789,168 ක්වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු. 3,067,093 ක් විය.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය
-------------------------------------

පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය මෙහෙයුම් අතිරික්තය රු. 3,722,075 කින් වැඩිවී තිබූ අතර, එය පසුගිය වර්ෂයට වඩා සියයට 121 ක වැඩිවීමක් බව නිරීක්ෂණය විය. මෙයට ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ පුනරාවර්ථන ආදායම්වල වැඩිවීම හා පුනරාවර්ථන වියදම්වල අඩුවීමයි.

2.3 ආදායම් පරිපාලනය
-----------------------

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්
-----------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. '000' | රු. '000' | රු. '000' |
| වරිපනම් හා බදු | 6,981 | 8,321 | 10,919 |
| බදු කුලී | 4,264 | 4,867 | 1,506 |
| බලපත්‍ර ගාස්තු | 469 | 383 | - |
| වෙනත් ආදායම් | 33,895 | 43,898 | 33,914 |

2.3.2. ආදායම් රැස්කිරීමේ කාර්යයසාධනය

------------------------------------------

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම, රැස්කල ආදායම සමඟ සැසඳීමේදී බලපත්‍ර ගාස්තු සහ වරෙන්තු හා දඩ යන ආදායම් විෂයයන් රැස්කල ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට 22 හා සියයට 5 ක අඩුවීමක් පෙන්නුම් කෙරිණි.

2.3.3 වරිපනම් බදු

---------------

විගණිත දිනය වූ 2015 නොවැම්බර් 20 දින වනවිටත් හිඟ වරිපනම් බදු පිළිබඳව වාර්තාවක් පිළියෙල කර නොතිබූ අතර, එදිනට 2014 වර්ෂය වෙනුවෙන් තවදුරටත් ලැබිය යුතු මුළු හිඟ මුදල වශයෙන් රු. 6,915,973 ක්ද, 2015 වර්ෂය වෙනුවෙන් බිල්කල ආදායමින් තවදුරටත් ලැබිය යුතු හිඟ මුදල වශයෙන් රු. 3,356,811 ක්ද පැවතුණි. එය 2015 වර්ෂය සඳහා බිල්කල ආදායමින් සියයට 52ක් බව නිරීක්ෂණය විය.

2.3.4 බදුකුලී

--------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඇහැලියගොඩ සතිපොල මාසිකව රු. 68,420 ක බදුකුලී මුදලක් පදනම්ව 2015 වසර සඳහා බදු දී තිබූ අතර, එකී බදු අයකිරීමේ කටයුතු 2015 ජුනි මස සිට නගර සංවර්ධනය හේතුවෙන් අක්‍රිය වී ඇති අතර, විගණිත දිනය වූ 2015 නොවැම්බර් 20 දින වනවිටත් කිසිඳු ආදායමක් උපයා නොතිබුණි.

(ආ) ගැටහැත්ත සතිපොල 2015 ජනවාරි 01 සිට 2015 දෙසැම්බර් 31 දක්වා වූ කාලයට මාසිකව රු. 17,925 කට බදු තිබූ අතර, 2015 සැප්තැම්බර් 30 දින වනවිට මාස 03 ක පමණ රු.58,247 ක හිඟ කුලී මුදල් පැවතුණි. පෞද්ගලික තැනැත්තෙකු සතුව තිබූ භූමියක් 2010 වර්ෂයේ බදු ඔප්පුවක් මඟින් මෙම සභාවට එක් වසරක් සතුව සතිපොල පැවැත්වීමට පවරා දී තිබූ අතර, විගණිත දිනය වූ 2015 නොවැම්බර් 20 දින වනවිටද එකී ඉඩම නැවත සභාව විසින් බදු ඔප්පුවේ කාලය දීර්ඝ කර ගැනීම හෝ අයිතිකරුට නීත්‍යානුකූලව පවරා ඉඩමේ නිරවුල් බුක්තිය භාරදීම හෝ සිදුකර නොතිබුණි.

(ඇ) ඇහැලියගොඩ ගවමස් වෙළඳසැල 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා එකම ටෙන්ඩර්කරුවෙකුට ටෙන්ඩර් ලබාදී තිබූ අතර, එම කාල පරාසය තුල ටෙන්ඩර් මුදලේ වැඩිවීම රු. 2,200 වැනි ඉතාමත් අඩු මුදලක් බව නිරීක්ෂණය විය. ඒ අනුව ඇහැලියගොඩ ගවමස් වෙළඳසැල ටෙන්ඩර් කිරීමේ ක්‍රියාවලිය විධිමත්භාවයකින් සිදු නොවන බවත්, විවෘත තරඟකාරීත්වයකට ලක්කර ටෙන්ඩර් නොකිරීම තුලින් සභාවට ලබාගතහැකි විශාල ආදායමක් අහිමි වී ඇති බවත් විගණනයේදී නිරීක්ෂණය විය.

(ඇ) සභා බල ප්‍රදේශයේ ප්‍රසිද්ධ වෙන්දේසි මඟින් විකුණනු ලබන ඉඩම් භූමි ප්‍රමාණයෙන් සියයට 10ක් පොදු කටයුතු සඳහා සභාව වෙත ඔප්පුවක් මඟින් ලබාදිය යුතු වුවත්, ඊට පටහැනිව දිවුරුම්පිටිය නරියමුල්ලගේන ඉඩම විකුණූ ප්‍රමාණය පර්චස් 476.11 ක් වුවත්, පර්චස් 25 ක ඉඩම් ප්‍රමාණයක් පමණක් සභාවට පවරා දී තිබුණි. ඊට අදාලව මුල් ඔප්පුව විගණනයට ඉදිරිපත් නොවූ අතර, එකී බිම් ප්‍රමාණය ඔප්පුවක් මඟින් පවරා දුන් බවට සාක්ෂිද ඉදිරිපත් නොවුණි. බිම් කොටසේ මායිම් පවා හඳුනාගත නොහැකි ලෙස ඉඩම වල්බිහිවී, ආරක්ෂිත වැටක් ඉදිකර හෝ සභාවට අයිති බවට දැන්වීම් පුවරුවක් ප්‍රදර්ශනය කර හෝ නොතිබූ අතර, ඉඩම වගුරුබිම් සහිත ප්‍රදේශයකට බෑවුම් සහිතව ප්‍රායෝජනවත් කාර්යයකට යොදා ගත නොහැකි ආකාරයේ බිම් කොටසක් වුණි. ඒ අනුව නීත්‍යානුකූලව නියමිත භූමි ප්‍රමාණයක් සහ ප්‍රයෝජනවත් බිම් කොටසක් වෙන් කර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි. ඊට අමතරව ඉඩම

වෙන්දේසි කර වසර 05 ක් ඉක්මවා ගොස් තිබුණද, විගණිත දිනය වූ 2015 නොවැම්බර් 20 දින වනවිටත් අදාල ඉඩම් කැබලි සඳහා ජල පහසුකම් සලසා නොතිබුණි.

(ඉ) සභාවට අයත් වෙළඳ සංකීර්ණ වල කඩකාමර වලින් 2012 ජනවාරි සිට 2015 සැප්තැම්බර් දක්වා රු. 43,650 ක හිඟ මුදලක් අයවීමට තිබුණි

2.3.5 බලපත්‍ර ගාස්තු
----------------

(අ) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පිහිටා ඇති කර්මාන්ත බදු, ව්‍යාපාර බදු හා වෙළඳ බලපත්‍ර ගාස්තු අයකල යුතු ව්‍යාපාර හඳුනාගැනීම උදෙසා වාර්ෂික සමීක්ෂණයක් විගණිත දිනය වූ 2015 නොවැම්බර් 20 දින දක්වාම සිදුකර නොතිබුණි. ව්‍යාපාර වර්ගය අනුව එකතුවන ආදායම පදනම් කරගෙන ආදායම් ලේඛණ පවත්වා තිබුණි.

(ආ) ව්‍යාපාර බලපත්‍ර හා කර්මාන්ත බදු යටතේ සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පනවා ඇති බදු සමාලෝචිත වර්ෂයේ අප්‍රේල් මස 01 දිනට පෙර සභාවට ගෙවිය යුතු වුවත්, එසේ සිදු නොවන අවස්ථා 15 ක් නිරීක්ෂණය වූ අතර, අප්‍රේල් 01 දිනට පසුව බලපත්‍ර ගාස්තු හා අදාල බදු ගෙවීම් පැහැරහැරි ආයතන වලට එරෙහිව 2014 දෙසැම්බර් 19 දිනැති අංක 1894 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් නිවේදනය පරිදි නීත්‍යානුකූලව කටයුතු කර නොතිබුණි.

2.3.6 වෙනත් ආදායම්
-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විගණිත දිනය වූ 2015 නොවැම්බර් 20 දින වනවිටත් බදුකරුවන් වෙතින් දීර්ඝ කාලයක් තිස්සේ පැවතඑන රු. 53,179 ක හිඟ අක්කර බදු ශේෂයක් අයවීමට තිබුණි.

(ආ) සභාව සතු පොදු වැසිකිලිය ත්‍රෛමාසික කාල සීමාවට අදාලව බදු දීම සිදු කරන අතර, 2015 සැප්තැම්බර් 30 දිනෙන් පසුව බදු ගිවිසුම අළුත් කර බදු දී නොතිබූ අතර, සභාවට ලැබිය යුතු ආදායමක් අහිමි වී තිබුණි. තවද, හිඟ බදු මුදල් හා හිඟ ජල බිල්පත් ගාස්තු වශයෙන් අයවිය යුතු රු. 17,917 ක හිඟ මුදල් හා 2015 ජූනි 01 සිට 2015 සැප්තැම්බර් 30 දින දක්වා කාල සීමාව වෙනුවෙන් රු. 13,950 ක හිඟ මුදල විගණිත දිනය වූ 2015 නොවැම්බර් 20 දින වනවිටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3.7 උසාවි දඩ හා මුද්දර ගාස්තු
------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අවිස්සාවේල්ල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් 2013 වසරේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා ලැබිය යුතු මුද්දර ගාස්තු හඳුනාගෙන ලබා ගැනීමට කටයුතු කර නොතිබූ අතර, 2014 ජූලි සිට දෙසැම්බර් දක්වා ලැබිය යුතු රු. 7,238,054 ක හිඟ මුද්දර ගාස්තු ලැබී නොතිබුණි. තවද, පෙබරවාරි සිට ඔක්තෝබර් දක්වා ලැබිය යුතු හිඟ මුද්දර ගාස්තු හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි. කොළඹ දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් 2014 ජනවාරි සිට 2015 ඔක්තෝබර් දක්වාද, රත්නපුර දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් 2014 සැප්තැම්බර් සිට 2015 ඔක්තෝබර් දක්වාද, හොරණ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් 2014 ජනවාරි, මාර්තු, අප්‍රේල්, මැයි, අගෝස්තු සහ නොවැම්බර් යන මාස සඳහාද, 2015 ජනවාරි සිට ඔක්තෝබර් දක්වාද ලැබිය යුතු මුද්දර ගාස්තු හඳුනාගෙන අයකර ගත යුතුව තිබූ අතර, 2014 පෙබරවාරි, ජූනි, ජූලි, සැප්තැම්බර්, ඔක්තෝබර් සහ දෙසැම්බර් මාස වෙනුවෙන් ලැබිය යුතු රු. 258,020 ක මුද්දර ගාස්තු විගණිත දිනය වූ 2015 නොවැම්බර් 20 දින වනවිටද අයකර නොතිබුණි.

(ආ) අවිස්සාවේල්ල මහේස්ත්‍රාත් අධිකරණයෙන් 2014 අප්‍රේල් සිට දෙසැම්බර් දක්වාද, 2015 ජනවාරි සිට 2015 ඔක්තෝබර් දක්වාද ලැබිය යුතු උසාවි දඩ මුදල්ද, රත්නපුර මහේස්ත්‍රාත් අධිකරණයෙන් 2012, 2013 හා 2014 වර්ෂ වෙනුවෙන්ද 2015 ජනවාරි සිට ඔක්තෝබර් දක්වාද ලැබිය යුතු උසාවි දඩ මුදල්ද හඳුනාගෙන අයකර නොතිබුණි.

03. මෙහෙයුම් සමාලෝචනය
-----------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා
-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඇහැලියගොඩ නගරයේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම යටතේ නාගරික සංවර්ධන අධිකාරිය මගින් ක්‍රියාත්මක කරන ලද කඩා ඉවත් කරන ලද ගොඩනැගිලි කොටස් ඉවත් කිරීම සඳහා සභා අනුමැතියකින් තොරව 2013 වර්ෂයේදී රු. 900,000 ක් අත්තිකාරම් වශයෙන් සභා අරමුදලින් වැය දරා තිබුණද, විගණිත දිනය වූ 2015 නොවැම්බර් 20 දින වනවිටත් නාගරික සංවර්ධන අධිකාරිය මගින් මෙම ව්‍යාපෘතිය සඳහා කිසිඳු ප්‍රතිපාදනයක් සලසා නොතිබූ බැවින් ගෙවන ලද අත්තිකාරම් මුදල ප්‍රාදේශීය සභා අරමුදලට අතිරේක වැය බරක් වී තිබුණි.

(ආ) සභාවේ සේවයේ නියුතුව සිට විශ්‍රාම ගිය හෝ ස්ථාන මාරු වී ගිය නිළධාරීන් 04 දෙනෙකුගේ සේවක ඇප ලෙස රඳවාගෙන තිබූ රු. 49,273 ක මුදලක් අදාල නිළධාරීන් වෙත නිදහස් කිරීමට විගණිත දිනය වූ 2015 නොවැම්බර් 20 දින වනවිටත් කටයුතු කර නොතිබුණි.

(ඇ) සභාපතිවරයාගේ නිල නිවාස දුරකථනයේ රු. 18,825 ක හිඟ මුදල් විගණිත දිනය වූ 2015 නොවැම්බර් 20 දින වනවිටත් ගෙවා නොතිබුණි.

(ඈ) සභා සීමාව තුල පිහිටි සුසාන භූමි අතරින් සුසාන භූමි 22 ක් පමණක් හඳුනාගෙන තිබුණද, ඒවාද මැනුම් කටයුතු සිදුකර සභාව වෙත විධිමත් පරිදි පවරාගෙන ලේඛණගත කල යුතුව තිබුණි.

(ඉ) විගණිත දිනය වූ 2015 නොවැම්බර් 20 දින වනවිටත් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජෙනරාල්ට ගෙවිය යුතු රු. 108,385 ක හිඟ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) 2011 ජුනි හා 2012 ජනවාරි මාස වල බැංකු සැසඳුමේ ඇති වෙනස්කම් පිළිවෙලින් රු. 2,300 ක් හා රු. 12,140 ක්වූ වෙනස හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(උ) 2006 වසරේ සිට පවත්වා ගෙනඑන නඩු 10 ක් සම්බන්ධයෙන් 2015 ජුනි 30 දින වනවිටත් නීතිඥ ගාස්තු වශයෙන් රු. 273,950 ක මුදලක් සභා අරමුදලින් වැය දරා ඇතත්, විගණිත දිනය වූ 2015 නොවැම්බර් 20 දින වනවිටත් තවදුරටත් නොවිසඳී පැවතුණි.

3.2 කොන්ත්‍රාත් පරිපාලනය
---------------------------

සබරගමුව පළාත් සභා ප්‍රධාන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මගින් 2009 වර්ෂයේ රු. 5,379,264 ක ඇස්තමේන්තුවක් පදනම්ව ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව මගින් ක්‍රියාත්මක කල දිවුරුම්පිටිය ජල යෝජනා ව්‍යාපෘතිය සඳහා විගණිත දිනය වූ 2015 නොවැම්බර් 20 දින වන රු.6,740,431 ක වියදමක් දරා තිබුණද, එකී ව්‍යාපෘතියේ අරමුණ ඉටු වී නොමැති බව භෞතික පරීක්ෂාවේදී අනාවරණය විය. ජල ගබඩා ටැංකිය, ලිඳ හා මෝටර් කාමරය ඉදිකර වසර ගණනාවක් ගතවී තිබුණද, එම දේපල වල ආරක්ෂාව සඳහා ආරක්ෂිත වැටක් ඉදිකර නොතිබූ අතර, ගණකැළෑව වැවී වල්බිහිවී අනාරක්ෂිතව තිබුණි. තවද, ජල ගබඩා ටැංකියට අදාල ඉඩම නීත්‍යානුකූලව සභාවට පවරා ගැනීමට විගණිත දිනය වූ 2015 නොවැම්බර් 20 දින වනවිටත් කටයුතු කර නොතිබුණි.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

3.3.1 අවිධිමත් ගණුදෙණු

---------------------

2005 ජූනි 08 දිනැති අංක 1396/18 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයට පටහැනිව සභා වාර සඳහා සහභාගී නොවූ හා වෛද්‍ය වාර්තා ඉදිරිපත් කර නොතිබූ සභිකයින් දෙදෙනෙකුට රු. 40,000 ක් සභික දීමනා ගෙවා තිබුණි.

3.4 වත්කම් කළමණාකරණය

-----------------------------

නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

-----------------------------------------

(I) සබරගමුව පළාත් සභා කාර්යාලයෙන් හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් 2013 හා 2014 වර්ෂ වල පරිත්‍යාග වශයෙන් ලද අංක RD – 5104 හා අංක RD – 6461 දරණ ගලිබවුසර් 02 ලැබූ දින සිට කිසිඳු ප්‍රයෝජනයකට නොයොදා නිෂ්කාර්යයව පැවති අතර, අංක LF – 4825 දරණ කැබ් රථය හා අංක QB – 4780 දරණ ත්‍රීරෝද රථයද ධාවනයෙන් තොරව නිෂ්කාර්යයව ගාල් කර පැවතුණි. ඒ සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ගයක් විගණිත දිනය වූ 2015 නොවැම්බර් 20 දින වනවිටත් ගෙන නොතිබුණි.

(II) ගැටහැත්ත බහුකාර්යය ගොඩනැගිල්ල ඉදිකර අවසන් වී වර්ෂ ගණනාවක් ගතවී ඇති අතර, රු. 1,625,866 ක් වටිනාකමැති වායු සමීකරණ යන්ත්‍ර 14 ක් 2014 දෙසැම්බර් 06 දින වනවිට සවිකර තිබුණි. විගණිත දිනය දක්වාම මෙම ගොඩනැගිල්ල නිෂ්කාර්යයව පැවති අතර, ගොඩනැගිල්ල අවට පරිසරයද අපවිත්‍ර වී පැවතුණි. ප්‍රවේශ මාර්ගයෙහි ඇති අනසවසර තාවකාලික කඩකාමර ඉවත් කර ප්‍රවේශ මාර්ගය සකසා නොතිබුණි. පසුගිය වර්ෂ වලට අදාල විගණන විමසුම මඟින්ද දිගින් දිගටම මෙම තත්ත්වය පෙන්වා දී තිබුණද, සභාව සතු ගොඩනැගිල්ල කිසිඳු ප්‍රයෝජනවත් කාර්යයකට යොදවා නොතිබීමෙන් සභාවට ලබාගත හැකි ආදායම් මාර්ගයක් අහිමි කරගෙන ඇති බව හා එම ගොඩනැගිල්ලේ යථා පැවැත්ම අවදානමකට ලක්ව ඇති බව විගණනය මඟින් තවදුරටත් නිරීක්ෂණය කෙරේ.

(III) පළාත් පාලන අමාත්‍යාංශය මඟින් 2015 පෙබරවාරි 06 දින මෙම සභාවට ලැබී තිබූ මෝටර් ග්‍රේඩරය විගණිත දිනය වූ 2015 නොවැම්බර් 20 දින වනවිටත් සභාවේ අවශ්‍යතාවයන්ට නොගැලපීම හා රියදුරෙකු නොමැති කමින් කිසිඳු ප්‍රයෝජනයක් නොගෙන පැරණි සභා ගොඩනැගිල්ලේ ගාල් කර තිබුණි.

3.5 ව්‍යාපෘති ප්‍රමාද කිරීම

-----------------------

සභාව විසින් කර්මාන්ත 07 ක් සම්බන්ධයෙන් රු. 955,374 ක් අත්තිකාරම් ලබා දී තිබූ අතර, විගණිත දිනය වූ 2015 නොවැම්බර් 20 දින වනවිටත් එකී අත්තිකාරම් පියවා නොතිබුණි. එසේම එම කර්මාන්ත ක්‍රියාත්මක වීද යන්න පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි.

3.6 සන අපද්‍රව්‍ය කළමනාකරණය

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොහිලදෙනියවත්ත කොම්පෝස්ට් පොහොර අංගනය ඉදිකිරීමේ කර්මාන්තය 2015 නොවැම්බර් 20 දින භෞතිකව පරීක්ෂා කල අතර, අක්කර 02 ක පමණ භූමියක පිහිටි ගොඩනැගිල්ල වල්බිහිවී කැළෑව වැවී පැවතුණි. බේරුවානවත්ත කොම්පෝස්ට් පොහොර අංගනයෙන් අර්ධ වශයෙන් සකස් කර ගෙනඑනු ලබන කසල පොහොර ක්‍රියාවලියෙහි නොයොදා නිසි වර්ග කිරීමකින් තොරව ඉටිකොල පවා සහිතව ගොඩනැගිල්ලේ තැනින් තැන ගොඩගසා තිබුණි. තවද, ගොඩනැගිල්ලේ විවෘත භූමියේ තැනින් තැන කසල ගොඩගසා තබුණු අතර, ඒවායේ ඇති ඉටිකොල, ටින්, ප්ලාස්ටික් වැනි දෑ විවෘත භූමියේම පුළුස්සන අතර, ඩෙංගු මර්ධන ව්‍යාපෘතිය යටතේ වසරක පමණ කාලයක් තිස්සේ එකතු කරන ලද ටින්, ප්ලාටික්, බෝතල් ආදී ද්‍රව්‍ය සම්බන්ධයෙන් කිසිඳු ක්‍රියාමාර්ගයක් නොගෙන පරිශ්‍රයේ ගබඩා කර තිබුණි. සභාවේ වගකිවයුතු නිලධාරියෙකුගේ අධීක්ෂණයකට ලක් වන බවට තහවුරු නොවූ අතර, ලොග් පොතක් නඩත්තු නොවුණි. මෙම ව්‍යාපෘතිය ගම්මානයක් තුල ක්‍රියාත්මක වන හෙයින් ඉහත සඳහන් තත්ත්වයන් යටතේ ජනතාවගේ යහපත් සෞඛ්‍ය පැවැත්මට හානිදායක තත්ත්වයක් පැනනැගිය හැකි බැවින් ඒ සම්බන්ධයෙන් විශේෂ අවදානයක් යොමු කල යුතු බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) බේරුවානවත්ත කොම්පෝස්ට් පොහොර අංගනය ඉදිකිරීම සම්බන්ධයෙන් පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ සභාපති හා කොන්ත්‍රාත්කරුවෙකු අතර රු. 4,034,056 ක මුදලකට 2015 අප්‍රේල් 20 දින ගිවිසුමකට එළඹ තිබූ අතර, වර්ෂයක පමණ කාලයක සිට බේරුවානවත්තෙහි විවෘත භූමියට කසල මුදාහරින බවත්, කොම්පෝස්ට් පොහොර ක්‍රියාවලිය නිසි පරිදි සිදු නොවන බවත්, කාර්මික නිලධාරී සමඟ 2015 නොවැම්බර් 19 දින සිදු කරන ලද භෞතික පරීක්ෂාවේදී අනාවරණය විය. තවද, ඉදිකරනු ලබන ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු මන්දගාමී ස්වරූපයක් පවතින බව නිරීක්ෂණය විය

04. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය.

-----------------------------------------

4.1 අයවැය පාලනය.

-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 23 කට අදාලව රු. 2,021,000 ක මුළු ප්‍රතිපාදන කිසිඳු කාර්යයක නොයොදා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුලදී වැය ශීර්ෂ 39 ක් සඳහා සලසා තිබූ මුළු ප්‍රතිපාදන මුදල් වැය ශීර්ෂ 62 කට රු. 11,542,513 ක මුදලක් මාරුකර තිබූ නමුත්, ඒ සඳහා සභා තීරණයක් හෝ කමිටු නිර්දේශයක් ලබාගෙන නොතිබුණි.

4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

--------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර ඒ අනුව කටයුතු කර නොතිබුණි.

4.3 අභ්‍යන්තර විගණනය

------------------------

අභ්‍යන්තර විගණන ඒකකය සඳහා අවශ්‍ය පහසුකම් සපයා ක්‍රියාත්මක කර නොතිබුණි.

4.4 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම

---

විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගෙන නොතිබුණි.

05. පද්ධති හා පාලනය

---

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය
(ඈ) කොන්ත්‍රාත් පාලනය
(ඉ) සන අපද්‍රව්‍ය කළමනාකරණය